GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/11/01

**මාධ්‍ය නිවේදනයයි**

**වැවේගම දිස්ත්‍රික් රෝහල් භූමියේ අවදානම් තත්ත්වය.**

හල්මුල්ල ප්‍රදේශයේ මෑතකදී සිදුවූ නායයාම සම්බන්ධව බදුල්ල දිස්ත්‍රික්කයේ රජයේ වෛද්‍යවරුන් ඇතුලු සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ඉතා අඩු පහසුකම් යටතේ ඉතා අවධානම් තත්ත්වයක වූවද සෞඛ්‍ය සේවාවන් පවත්වා ගැනීම සහ තොරතුරු කලමණාකරණය සිදු කරනු ලබයි. බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයට අයත් බල ප්‍රදේශයේ පිහිටි වැවේ ගම දිස්ත්‍රික්ක රෝහල පැය 24 ක් පුරාම ක්‍රියාත්මක වන වෛද්‍යවරුන් දෙදෙනෙකුගෙන් පමණක් සමන්විත වූ රෝහලකි. එහි වෛද්‍යවරුන් දන්වා සිටින පරිදි වැවේගම රෝහල වසර ගණනාවක් තිස්සේ නායයාමේ අවධානමක් සහිත බව දන්නවා තිබූ නිසාත් එම රෝහලේ ගොඩනැගිලි වල ඉරි තැලීම් ආදිය සිදු වී ඇති නිසාත් එම අවධානම සලකා බලා රෝගීන් සහ රෝහල් කාර්ය මණ්ඩලය තාවකාලිකව ඉවත්කර ගැනීමට යෝජනා වුණි. තවද, මේ සම්බන්ධව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමාට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මගින් දැනුවත් කරන ලදී.

කෙසේ වෙතත් එම සේවාවන් පවත්වා ගැනීම සඳහා රෝහල් කාර්ය මණ්ඩලය මාස්පන මාතෘ සායන ගොඩනැගිල්ලේ කටයුතු ආරම්භ කර ඇති අතර වැවේගම දිස්ත්‍රික්ක රෝහලේ ප්‍රතිකාර ලබා ගන්නා රෝගීන් සඳහා රෝගී සත්කාර සේවා ලබා දීම ආරම්භ කර ඇත. කරුණු මෙසේ තිබියදී යම් ප්‍රාදේශීය දේශපාලඥයකු විසින් මෙම සත්කාරයට උදව් දෙනවා වෙනුවට ජීවිත අවදානමද නොතකා ක්‍රියාත්මක වන වෛද්‍යවරුන් අපහසුතාවයට පත් කරමින් තර්ජනාත්මක ලෙස හැසිරී ඇත.

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මෙම ක්‍රියාව දැඩි ලෙස හෙලා දකින අතර සෞඛ්‍ය බලධාරීන් හා රජය විසින් මෙම වෛද්‍යවරුන් රැක ගැනීමට මීට වඩා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සැකසිය යුතු බව අවධාරණය කර සිටිමු. කෙසේ වෙතත් එම ප්‍රදේශයේ සෞඛ්‍ය තත්ත්වය හා සනීපාරක්ෂණය පිළිබඳ උද්ගත වන ගැටලු සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ඌව පලාත් ශාඛාවේ 0717804805 දරණ දුරකථන අංකය ඇමතීමෙන් උපදේශන හා සේවාවන් ලබා දීමට කටයුතු කර ඇත.

ස්තූතියි,

වෛද්‍ය ලසන්ත පින්දාස
ලේකම්

| | | | |
|---|---|---|---|
| වැඩිදුර විස්තර සඳහා - | වෛද්‍ය පාලිත රාජපක්ෂ | - | 071840300 |
| | වෛද්‍ය නලින්ද හේරත් | - | 0717876516 |